# මනුෂ්‍ය සංජානනය සඳහා මොළයේ භූමිකාව

## මනෝමය කය සහ සිරුරෙන් බැහැර අත්දැකීම (OBE)

https://puredhamma.net/abhidhamma/gandhabbaya-manomaya-kaya/manomaya-kaya-and-out-of-body-experience-obe/

"මනෝමය කය (ගන්ධබ්බයා ) සහ භෞතික ශරීරය" මෙතෙක් ඔබ කියවා නැත්නම් මෙම ප්‍රකාශනය කියවීමට පෙර එය කියවන්න .

1. මනෝමය කය හෝ මනෝමය සිරුර, ඝණ භෞතික ශරීරය වසා පැතිරීපවත්නා ( අතිපිහිතව) "ජීවය දෙන ශක්ති ක්ෂේත්‍රය" ( එයට සියුම් රූප කොටස්ද ඇත) වශයෙන් යමෙකුට සිතින් මවා ගත හැක. **සක්‍රීය මනස, චිත්තජ කය ( සිතිවිලි ධාරාව) පවතින්නේ හදය වත්තු සේ හඳුන්වන ඉතා සියුම් රූප හා ආශ්‍රිතව මනෝමය කයෙහිය. සිතිවිලි හට ගන්නේ එහිය.**

2.මනෝමය කය භෞතික සිරුරට සම්බන්ධව පවත්නා විට හදය වත්තු සහ මොළය ( භෞතික ශරීරයේ ස්නායු පද්ධතිය සමග) යන දෙකම සහභාගී කර ගන්නා යාන්ත්‍රණයකින් සිතිවිලි ජනනය කරයි. යමෙක් වියපත් වීමත් සමග සිතීමේ ශක්තිය පිරිහී යන්නේ එහෙයිනි. කෙසේවෙතත්,හදය වත්තු මොළය වසා පැතිරී පවතින්නේ නැතිවුවත් එය භෞතික හදවතට අතිපිහිතව පවතී.

මොළය භෞතික ශරීරයේ කොටසක් වන අතර භෞතික ශරීරය සහ *මනෝමය කය* අතර අන්තර්ක්‍රියා කරන්නාවූ සම්බන්ධකය වේ.

3. පුනරුත්පත්තියෙහිදි (පටිසන්ධි) මනස පමනක් නොව අනෙක් අභ්‍යන්තර ඉන්ද්‍රියයන් පහ (පසාද රූප) පවා මනෝමය කය සමග උපදී. මේ සියල්ලම අපගේ ඇසට නොපෙනෙන සියුම් රූපය. එහෙයින් මනෝමය කය යනු, භෞතික ශරීරය වසා

පැතිරීපවත්නා ( අතිපිහිතව) නිෂ්ක්‍රිය භෞතික ශරීරයට ජීවය දෙන "ශක්ති ක්ෂේත්‍රය" වශයෙන් සිතින් මවා ගත හැක.

මනෝමය කය භෞතික ශරීරයෙන් වෙන්වන අවස්ථාව, කඩුවක් කොපුවෙන් ඉවතට ගන්නා මෙන් හෝ සර්පයෙක් සැව හරින්නා වැනියයි බුදුන්වහන්සේ වදාළ සේක. මනෝමය කය සිරුරෙන් ඉවතට ගිය පසු සිරුර නිෂ්ක්‍රිය ලී කඳක් වැනිය. යමෙක් මරණයට පත්වන විට සිදුවන්නේත් එයමය. මනෝමය කය ඉවතට යාමත් සමග ප්‍රාණවත් බව නැතිව යයි.

4.මෙම මනෝමය කයට "ගන්ධබ්බය" යයි කියනු ලැබේ. යම් පුද්ගලයෙක් මරණයට පත්වනවිට, එම පුද්ගලයාගේ "මනුෂ්‍ය භවයේ " කම්ම ශක්තිය තවමත් ඉතිරිව ඇත්නම් "ගන්ධබ්බය" මල සිරුරෙන් ඒ ආකාරයෙන්ම ඉවතට පැමිනේ. "ගන්ධබ්බය" ගේ කම්ම බීජයන්ට හා "ගති" වලට අනුකූල සුදුසු ගර්භයක් හමුවන තෙක් ඒ අයුරින් වසර ගනනාවක් වුවද සිටී.

5. ගන්ධබ්බයා ගේ ශ්‍රවනය හැකියාව සහ දෘෂ්ටිය ඉතා උසස් මෙන්ම වැඩි නම්‍යතාවයකින් යුතුව පවතී. ඇස් හා කන් පසාද රූපයන්ගේ හැකියාවන් භෞතික ඇස හා භෞතික කන සමග ක්‍රියා කිරීමේදී හීණවේ.

ඇත්තවශයෙන්ම ගන්ධබ්බයා ගේ සිරුර සියුම් නිසා ස්පර්ශ,රස සහ බොහෝ විට ගඳ සුවඳ දැනීමේ හැකියාවක් පවා නැත. මනොමය නය භෞතික ශරීරයෙන් වෙන්වූ විට, දැකීමට ආලෝකය අවශ්‍ය නැත. ( යමෙකුට බොහෝ ඈත දැක බලා ගත හැක). එසේම ශ්‍රවනය සඳහා වාතය ශබ්ද තරංග සන්නයන මාධ්‍යයක් සේ අවශ්‍ය නොවේ ( බොහෝ ඈත හටගන්නා ශබ්ද ශ්‍රවනය කළ හැක). දෘශ්‍ය ශ්‍රව්‍ය දෙකම සිදුවන්නේ කිරණ ඔස්සේය ( විද්යුත් චුම්භක විකිරණය මගින්). එසේම ගන්ධබ්බයාට අධි වේගයකින් ගමන් කළ හැක. එය භෞතික ගමනාගමනයක් නොවේ. නිදසුනක් වශයෙන් ඉද්ධි බල ඇති බුදුන්වහන්සේ හෝ අරහතුන් වහන්සේලා ඉතා ක්ෂණිකව අත නවා දිගහරින්නට යන කාලයට සමාන කාලයකින් දේව ලෝක වලට වැඩිය බව සූත්‍ර දේශනාවල සඳහන් වේ.

6. මනෝමය කය (ගන්ධබ්බයා) භෞතික ශරීරය හා එක්වූ පසු ශ්‍රව්‍ය දෘශ්‍ය කාර්යයන් දෙකම සිදු කරන්නේ භෞතික කණ සහ භෞතික ඇස ඔස්සේය. ඇත්තෙන්ම එය යුධ ටැන්කියක් තුල සිටින අයෙක් පිටත නැරඹීමට සහ බාහිර ශබ්ද ශ්‍රවනය කිරීමට ටැන්කියෙන් පිටත සවිකර ඇති උපකරණ භාවිතා කරන්නාක් මෙනි.

යමක් නරඹන්නේ භෞතික ඇස ආධාරයෙනි. මනෝමය කයෙහි "ඇස" ( ඇස ඉන්ද්‍රිය ) භෞතික ඇස අභ්‍යන්තරයේ පිහිටා ඇත. එය කණ සම්බන්ධයෙන්ද එසේමය. එහෙයින් ඇස් හා කන් ටැන්කියෙන් පිටත සවිකර ඇති උපකරණ මෙනි. එහෙයින් වයස් ගත වීමත් සමග භෞතික ඇස් හා කන් වල හැකියාවන්ද හීන වන නිසා පෙනීම සහ ශ්‍රවන හැකියාවන්ද දුර්වල වේ. මොළය ටැන්කියේ සවි කර ඇති බැහැරින් ගෙන එන සංඥ සකස් කරන්නාවු පරිගනකය හා සමානය. එහෙයින් මෙම භෞතික උපකරණ තුනෙන් එකකට ( මොළය, ඇස් සහ කන්) හෝ ආබාදයක් සිදුවූවහොත් පෙනීමේ, ශ්‍රවනය කිරීමේ හැකියාව හීන වේ නැතහොත් සම්පූර්ණයෙන්ම නවතිනු ඇත.

7. කෙසේවෙතත්, සැබෑ ශ්‍රවණය සහ දැකීම සිදුවන්නේ මනෝමය කය ආශ්‍රිත පසාද රූප දෙක ( අභ්‍යන්තර ඇස් හා කන්) ඔස්සේය. නිදසුනක් වශයෙන් ඔබ මොබ ඇවිද යන විට අන් අය සහ වස්තූන් වල නොගැටී ගමන් කිරීමට ඒවා අතර දුරප්‍රමානය නිශ්චය කරගන්නේ කෙසේදැයි ඔබට සිතුනේද? භෞතික ඇසට වස්තූන් අතර දුර ( දර්ශන පථයේ ගැඹුර) ගනනය කිරීමේ හැකියාවක් නැත."The Sense of Being Stared At" by Rupert Sheldrake (2003, p.12). කියවන්න. අපගේ ඇස්වලට බොහෝ දේ එකවර දැක ගැනීමේ හා ඒවා අතර සාපේක්ෂ දුර ගනනය කිරීමේ හැකියාවක් ඇත, එහෙත් එම හැකියාව ඇත්තේ *පසාද රූප* වල මිස ඇස්වල හෝ මොළයේ නොවේ.

8.ගන්ධබ්බයාගේ සිරුර ඉතා සියුම් වන හෙයින් භෞතික පහසක් ඇති කරගත නොහැකි නිසා ගන්ධබ්බයාට සුවඳ, රස හෝ පහස නොදැනේ. එහෙත් *ගන්ධ* ( Aroma) වලින් ශක්තිය උරා ගැනීමේ ක්‍රම වේදයක් ගන්ධබ්බයාට ඇත. එහෙින් හෙතෙම ගන්ධබ්බ වේ ( "ගන්ධ " + "අබ්භ" මෙහි අබ්භ යනු ලබා (උරා) ගැනීමයි).

9. කයයන් දෙක එක්ව පවතින විට මනෝමය කයේ (ගන්ධබ්භයා) හදය වත්තු භෞතික හදවත වසා පැතිරීපවතී. එහෙත් සමහර අවස්ථාවන්හීදී මනෝමය කය භෞතික කයෙන් වෙන්ව පවතී, එය සිරුරෙන් බැහැර අත්දැකීම (OBE) සේ හැඳින්වේ. සාමාන්‍යයෙන් එය සිදුවන්නේ මානසික ආතතිය සහිත අවස්ථාවන්හිදිය ( උදා. මරනාසන්න අත්දැකීම් (NDE) සේ සාමාන්‍යයෙන් හඳුන්වන අවස්ථාවන් හෝ ශල්‍යකර්මයකදී), සමහර පුද්ගලයිනට තමන් කැමති විටක එම තත්ත්වය ලබා ගතහැකිය.

මෑතකදී පලකල "Dying to be me: My Journey from Cancer, to Near Death, to True Healing", by Anita Moorjani (2012),ග්‍රන්ථයෙහි ඇය ලත් සිරුරෙන් බැහැර අත්දැකීම් මැනවින් විස්තර කර ඇත.

- ජුරැසික් පාක් නවකථා වෙහි ප්‍රසිද්ධ ගත්කරු වන මයිකල් ක්‍රික්ටන් (Michael Crichton) ගේ Travel ග්‍රන්ථයේ (1988, 307 වන පිටුව) ඔහුගේ හැතියාවන් ගැන මෙසේ ලියයි "shift my awareness out of my body and move it around the bedroom", ඔහු සඳහන් කරන අන්දමට , "..I didn't think anything about it… I assumed that anybody could do it..". ඒ හා සමාන විස්තරයක් ඉදිරිපත් කළ කතුවරියක් පැවසුවේ " සැමටම එය කළ හැකි යයි ඈ සිතූ බවයි" මෙම වෙබ් අඩවියට යන්න:

http://abcnews.go.com/Health/woman-body-experiences/story?id=22825927

ඇත්තවශයෙන්ම OBE ගැන රචිත පොත් රාශියක් ඇත. ජීවිතයෙන් ඔබ්බෙහි ඇති සම්ප්‍රජානනය "Consciousness Beyond Life", by Pim van Lommel (2010) හෘද ශල්‍යයකර්ම වලට භාජනයවූ අය අත්විඳි OBE අවස්ථාවන් ගැන විස්තරාත්මක සටහන් ඉදිරිපත් කර ඇත..

# භූමිතල 31 හි පවත්නා ශරීර විලාස : මනෝමය කයෙහි ඇති වැදගත් කම

1. “The Grand Unified Theory of Dhamma“, ප්‍රකාශනයේ භූමි තල 31 පැවැත්ම පළිබඳව කෙටියෙන් සාකච්ඡා කළෙමු. අනාගාමි පුද්ගලයින්සඳහා වෙන්වූ ශුද්ධාවාසයන්හි හැරෙන්නට අපගේ දීර්ඝවූ අතීත සංසාර ගමනේදී අන් සියලුම භූමි තල වල අප ජීවත්ව ඇත. පුනරුත්පත්ති ක්‍රියාදාමයේ කාල පරිමානය ගැන දැනගැනීමට “සංසාරික කාලපරිමානය” කියවන්න.

විවිධ භූමිතල වල පවත්නා විවිධ භෞතික ශරීර විලාස ගැන දැන සිටීම ප්‍රයෝජනවත් වේ, විශේෂයෙන්ම මනෝමය කය ගැන යම් අදහසක් ඇති කර ගැනීමටත් අපගේ භෞතික ශරීර මොනතරම් කරදරකාරී දෙයක්දැයි අවබෝධ කරගැනීමටත් ඉවහල් වේ.

එසේම අපගේ භෞතික ශරීරය හා විශේෂයෙන්ම එහි ඇති මොළය මෙම දුක්ඛ වේදනාවන්ගෙන් පිරුණු සංසාරයෙන් ( පුනරුත්පත්ති චක්‍රය) ගැල වී යාමට උපකාර වන අයුරු අවබෝධ කරගැනීමට හේතු වේ. බොහෝ දෙනෙකුට මෙම කොරතුරු අලුත් දෙයක් විය හැක, එහෙයින් ඉතා සෙමෙන් මෙන්ම අනෙක් තොටස් නැවත නැවත කියවා කරුනු තහවුරු කරගන්න. මොළයේ භූමිකාව ගැන අවබෝධ කර ගැනීමට මූල ධර්ම ගැන මනා අවබෝධයක් තිබීම වැදගත් වේ.

2. සමහර ව්‍යාතිරේක ( exceptions බැහැර කිරීම් ) ඇතත්, පහත භූමි තල වල ඝන ශරීර ඇතිබව හා උසස් භූමිතල වල සිරුරු සැහැල්ලු හා සියුම් සිරුරු බව දළ

රීතියක් සේ ගත හැක. නිදසුනක් වශයෙන් සමහර ප්‍රේතයින්ට ඇත්තේ සියුම් සිරුරුය.

පහත්ම නිරයේ ( අපාය) වාසීන්ට ඇත්තේ විවිධාකාර වද හිංසාවන්ට ලක්විය හැකි ඝන සිරුරුය.

මනුෂ්‍ය සහ තිරිසන් ලෝකවල ජීවීන්ට ඇත්තේ ඝන සිරුරු බව අපට දැකිය හැක. දේව ලෝක 6 කින් සමන්විත දේව භූමිතලයේ සිරුරු ඉතා සියුම් වන නිසා අප ඉදිරියේ සිටියත් සාමාන්‍ය මනුෂ්‍යයෙකුට දේව ලෝක වාසීන් දැක ගත නොහැක. එහෙත් අභිඥා ශක්ති ඇති අයෙකුට දේව ලෝක වාසීන් දැක ගත හැක.

එහෙයින්, *කාමලෝක* තල වල ජීවත් වන්නන්ට ඇත්තේ සාමාන්‍යයෙන් සියලු පංච ඉන්ද්‍රියන්ම වන ඇස්, කන්, නාසය, දිව සහ භෞතික පහස ඇති ඝන ශරීරයයි පැවසිය හැක. එහෙත් දේව ලෝකවාසීන්ගේ සිරුරු (සමහර ප්‍රේත යන්ගේ) අනෙක් භූමිතල වලට වඩා ඝන බවින් අඩුය. දේව සිරුරු ඝන බවින් අඩු වුවත් මනස ඇතුළු ඉන්ද්‍රියන් මංඩල සියල්ලම ( සයම) දේව ලෝක වාසීන්ට ඇත.

3. ඊලඟ උසස් තලය වන්නේ *රූප ලෝක* තලය. *රූප ලෝක* වාසීන් හඳුන්වන්නේ සියුම් සිරුරු වලින් යුත් *රූපි බ්‍රහ්ම* හෝ *බ්‍රහ්ම* වශයෙන්ය. ඔවුනට ඇත්තේ ඇස්, කන් ( භෞතික ඉන්ද්‍රිය 2 කි) හා මනස යන ඉන්ද්‍රිය මංඩල 3 පමනි. දේව ශරීරවලටත් වඩා සැහැල්ලු සිරුරු නිසා දේව ලෝක වාසීනට පවා රූපි බ්‍රහ්ම යන්ගේ සියුම්වූ ශරීර දැක ගත නොහැක.

ඊලඟ උසස්ම තලය වන්නේ *අරූප ලෝක* තලය. *අරූප ලෝක වාසී අරූප බ්‍රහ්ම* යන්ට ඇත්තේ මනස *( හදය වත්තු)* පමනි, භෞතික ඉන්ද්‍රිය මංඩලයන් කිසිවක් නැත. *අරූපී බ්‍රහ්ම* යන පදය එනම් "භෞතික සිරුරක් නැති බ්‍රහ්ම" භාවිතයට පැමිනියේ එම බ්‍රහ්මයන් ගේ ඉතා සියුම් පදාර්ථ රූප වන *හදය වත්තු* පුරාණ යොගීන්ට නොපෙනුන නිසාය.

4. මෙම පසුබිම ගැන අවබෝධයෙන් යුතුව විවිධ භූමි තල වල සිරුරු සෑදී ඇති අයුරු ගැන අභිධම්ම යෙහි විස්තර කරන්නේ කෙසේදැයි විමසා බලමු.

අරූප ලෝකවල අරූපී බ්‍රහ්ම යන්ට ඇත්තේ හදය වත්තු පමනක්ය. එය මනසේ මූල් පදනමයි, එය *වත්තු දශක* යනුවෙන් හඳුන්වයි, එයද බුද්ධ ධම්මයෙහි සඳහන් කුඩාම ඒකකය වන ශුද්ධාෂ්ටක හා ප්‍රමානයෙන් සමානය. එය වත්තු දශක ( දශක යනු ඒකක දහයක් යන්නයි) යයි හඳුන්වන්නේ ශුද්ධාෂ්ටක වල භ්‍රමන/පරිභ්‍රමන ස්වභාවය නිසාය. වසර 2500 පෙර භ්‍රමන/පරිභ්‍රමන න්‍යාය පළමුවෙන්ම හඳුන්වා දුන්නේ බුදුන්වහන්සේ විසිනි. අප එය පසුව සාකච්ඡා කරමු. හදය වත්තු නවීන විද්‍යාවේ පරමානුවට වඩා ඉතාමත් කුඩාය. වැරදි වැටහීමකින් අරූප ලෝකවල පදාර්ථ නැතැයි සිතන්න ඇත්තේ එහෙයිනි. එහි නොසැලකියයුතු තරම් සූක්‍ෂමවූ පදාර්ථ ඇත. පංචක්කන්ධ නොමැතිව විඤ්ඤාණයට පැවතිය නොහැකි යයි බුදුන්වහන්සේ දේශනා කළ සේක. එසේම, නොගිණිය යුතු තරම් කුඩා වුවත් අරූපලෝක වල පංචක්කන්ධ යන්හි *රූප* සංරචකයක් ඇත.

අරූපී බ්‍රහ්මයෙකුගේ *"හදය වත්තු"* සෑදී ඇත්තේ එම පැවැත්මට හේතුවූ *"කම්ම ශක්තිය"* නිසාය, එම බ්‍රහ්මයා උත්පත්තිය ලබන මොහොතේම *"හදය වත්තු"* සකස්වේ. සෑම සචේතනික ජීවියෙකුටම මනසක් ඇති හෙයින් *"හදය වත්තු"* ඇත.

5. රූප ලෝක වල බ්‍රහ්මයින්ට උත්පත්ති මොහොතේදීම, *"කම්ම ශක්තිය "*මගින් (රූප) පදාර්ථ ඒකක 3 ක් සාදයි. පදාර්ථ ඒකක 3 කින් සමන්විතව පටිසන්ධි මොහොතේදී හටගන්නා මෙම මූලාරම්භක කයට *"ත්‍රිජා කය"* යයි කියනු ලැබේ. ඒකක 3 නම්: *කම්මජා කය, චිත්තජා කය* සහ *උතුජා කය* යයි. උතුජා කය ඉතා සියුම් භෞතික සිරුරකි, එවන් රූපී බ්‍රහ්ම යින්ට ශ්‍රව්‍යය මෙන්ම දෘශ්‍ය හැකියාවන්ද ඇත.

එම රූපී බ්‍රහ්ම යින්ට *කාය දශක, වත්තු දශක, භව දශක* සහ දැකීමට සහ ශ්‍රවනය සඳහා *චක්කු පසාද* සහ *ශෝත පසාද* යන *පසාද රූප* දෙකක් සහිත *කම්මජා කයක්* ඇත්තේය. මෙම *පසාද රූපද* අත්‍යවශ්‍යයෙන්ම විවිධ *භ්‍රමන/පරිභ්‍රමන* ප්‍රකාර සහිත *ශුද්ධාෂ්ටක* වේ.

*"කය"* යන්න "සිරුර" යයි පරිවර්තනය කළත්, රූපී බ්‍රහ්ම යකු සතු එකම "භෞතික සිරුර " වන්නේ *"උතුජා කය "*පමනි. එහෙයින් කය යනු භෞතික සිරුරක් බව ඉන් අදහස් කරන්නේ නැත. රූපී බ්‍රහ්ම යන්ගේ භෞතික සිරුර ( *උතුජා කය*) දේව හා සන්සන්දනය කළ විට බෙහෙවින් සියුම් වන නිසා, අපට දේව යන් නොපෙනෙන්නා සේ දේව යන්ට රූපී බ්‍රහ්ම යන්ද නොපෙනේ. දේව මෙන්ම බ්‍රහ්ම යන්ට ආලෝකයේ අධාරයකින් තොරව පෙනෙන්නා සේම ශබ්ද තරංග සම්ප්‍රේෂණය කිරීමට වාතය නොමැතිව වුවත් ශ්‍රවණය කළ හැක. රූපී බ්‍රහ්ම යන්ගේ භෞතික සිරුරෙහි අපට මෙන් ඇස් හා කන් නැත. එහෙයින් ඔවුනට බොහෝ ඈත දුරවූ ශබ්ද ඇසේ දර්ශණ දැකිය හැක. ඔවුන් කැමති පරිදි ක්ෂණයකින් ඕනෑම තැනකට ගමන් කළ හැක.

ඔවුන්ට යමක් දර්ශනය වන ආකාරයට සමීපතම නිදසුන වන්නේ අප සිහින දකින ආකාරයයි. සිහින දකින්නේ ඇස් වලින් නොවේ. බ්‍රහ්මයන් දර්ශන ප්‍රත්‍යක්ෂ හෝ ප්‍රග්‍රහණය කරයි. මතුවට දැක්වෙන වැඩි විස්තර සමග මේය වඩාත් පැහැදිළි වනු ඇත.

6. ප්‍රායෝගික දැනීම මත දෙන පොදු මග පෙන්වීම වන්නේ පහත් භූමිතල වාසීන්ට උසස් ලෝක වාසීන් නොපෙනෙන බවයි.කෙසේවෙතත්, අභිඥ ශක්තිය ඇති මනුෂ්‍යයින්ට උසස් භූමිතල වාසීන් දැක ගත හැක.

කාමලෝක වල උසස්ම භූමි තල වන්නේ දේව ලෝක වේ. බ්‍රහ්ම වර්ග දෙක මෙන්ම දේව ලෝකවලදද උත්පත්තිය ලබන්නේ ක්ෂණිකවය එනම් ඕපපාතිකවය. එහෙත් දේව යන්ට සිව්වන වර්ගයට අයත් *"කරජා කය"* නමින් හඳුන්වන අපගේ සිරුර මෙන්වූ කයක්ද ඇත. අපට මෙන්ම ඔවුන්ගේ *"කරජා කය"*පවත්වා ගන යාම පිණිසද විධිමත්ව ආහාර ( *"අමූර්ත"*) පරිභෝජනය කළ යුතු වේ.*"කරජා කය"* , පවත්වා ගැනීමට ආහාර අවශ්‍යවන නිසා එයට *"ආහාරජා කය"* යයිද කියනු ලබයි.

එහෙයින් දේව සතුව "සිරුරු සතරක්" හෝ *"චතුජා කය"* එනම් ***කම්මජා කය, චිත්තජා කය*** ,*උතුජා කය* සහ *කරජා කය* යයි සිරුරු සතරක් ඇත. එහෙත් දේව සහ බ්‍රහ්මයින් අසනීප වන්නේ නැත. එය පැවැත්දට අවශ්‍ය කම්ම ශක්තිය ගෙවී ගිය පසු මරණයට පත්ව අතුරුදහන් වේ.

7. මනුෂ්‍යයින් මෙන්ම තිරිසන් සතුන්ද එම පැවැත්මට මුල්වතාවට උපත ලබනා විට ඔවුන්ද දේව ආකාරයට සමාන අයුරින්, නමුත් වඩාත් සියුම්වූ ශරීරයකින් ක්ෂණිකව පහල වේ. මෙය ඉහත සඳහන් කළ ගන්ධබ්බයා අවස්ථාව හෙවත් ගන්ධබ්බ අවස්ථාවයි. "මනෝමය කය- හැඳින්වීම " සහ මතු සඳහන් අනෙක් අදාළ ලිපි කියවන්න.

නිදසුනක් වශයෙන් මනුෂ්‍යයෙකුගේ මරණින් පසු තව දුරටත් "මනුෂ්‍ය භව"සඳහා අවශ්‍ය කම්ම ශක්තිය ඉතිරිව ඇත්නම් හෙතෙම මනුෂ්‍යයෙකු සේ නැවත උත්පත්තිය ලබයි; එසේ කම්ම ශක්තිය ඉතිරිව නැත්නම් අතීත ප්‍රබල කම්ම විපාකවලට අනුකූලව වෙනත් භවයක් අල්වා ගනී. නිදසුනක් වශයෙන් ඔහුගේ ඊලඟ භවය මුවෙක් මෙන් විය හැක.

හෙතෙම මනුෂ්‍යයෙකු සේ නැවත උත්පත්තිය ලබයි නම් "මනුෂ්‍ය *ගන්ධබ්බයා*" මළ සිරුරෙන් ඉවතට එයි, ඔහු මුවෙක් සේ නැවත උපදී නම් "මුව *ගන්ධබ්බයා* " මළ සිරුරෙන් ඉවතට එයි.

8. මනුස්‍ය හෝ තිරිසන් *ගන්ධබ්බයෙකුගේ* සිරුරද *දේව* යන්ගේ මෙන් *"වතුජා කය"*ම වේ, එහෙත්, දේව *"වතුජා කය"*ට වඩා සියුම්ය.*ගන්ධබ්බයාට* ආහාර ලබා ගැනීමට කළ හැක්කේ ගඳ සුවඳ ආඝ්‍රාණය කිරීම පමනි.*ගන්ධබ්බයා* (*"ගන්ධ" + "අබ්බ")* යන නමින් අදහස් කරන්නේද එයමය. *ගන්ධබ්බයා* බෙහෙවින් විසිරුනු ස්වභාවයෙන් පවත්නා නිසාද ඉතා සියුම් වන හෙයින්ද මවකගේ ඝන සිරුර තුලින් පහසුවෙන් ගර්භාසයට ඇතුළු වී ජන්මානු දෙකක සංයෝගයෙන් සෑදුන සෛලයට ( Zygote : සංසේචිත ඩිම්භය) හා එක් වී කළළයට පදනම දමයි."මනෝමය කය - හැඳින්වීම " කියවන්න.

**දේව සහ බ්‍රහ්මයින්ට මෙන් *ගන්ධබ්බයා* ටද ඈත දුර පෙනීම මෙන්ම ඇසීමටද හැකිය.**ගන්ධබ්බයාට ඇස් කන් දරා සිටීමට තරම්වන ඝන සිරුරක් නැත.( එවැන්නත් පරිකල්පනය කිරීම පහසු නැත. එහෙත් අප සිහනයක් දකින විට සිදුවන්නාවු සංසිද්ධියට සමානය. සිහිනයක් දැකීමට ආලෝකය අවශ්‍ය නැත; අප සිහන දකින්නේ රෑ ඝන අඳුරේය, අප සිහන දකිව්නේ ඇස් වලින් නොවේ).

ගන්ධබ්බයෙකු වීම හොඳ යයි යමෙක් සිතුවත්, "මනුෂ්‍ය *ගන්ධබ්බයා* " සිටින්නේ සදාතනික ආතතියකිනි ( දැඩි මානසික වේදනාවකින්ය). කය ඉතා සියුම් නිසා *ගන්ධබ්බයාට* පහස නිසා ලබන්නාවූ ඉන්ද්‍රිය සංතර්පනයකින් සතුටට පත්විය නොහැක, ආහාර රස විඳිය නොහැක, කිසිවක් ග්‍රහනය කළ නොහැක. **මේ සියල්ලටම වඩා *ගන්ධබ්බයා,* සාමාන්‍ය මිනිසුන් රස ආහාර රස විඳිමින්, ලිංගික ආස්වාද ආදියෙන් ජීවිතය විනෝදයෙන් ගත කිරීම දක්නට හැකි නිසා මානසික වේදනාවෙන් පෙළේ.**

දේව සහ බ්‍රහ්මයින්ටද මිනිසුන්ගේ එම ක්‍රියාකාරකම් ( ඔවුනට අශ්‍යෙ නම් ) දකින්නට පිළිවන. එහෙත් ඔවුනට එවන් "රළු තෘප්තිය" යන් ගැන මොනම ඇල්මක්වත් (උපාදාන) නැත. අභිඥ ශක්තිය ලබා ගත් මනුෂ්‍යයෙකුගේ මෙන් ඔවුනගේ මානසික මට්ටම බෙහෙවින් උසස්ය. දේව සහ බ්‍රහ්මයින් මිනිස් සිරුර දැකීම පිළිකුල් කරන බව පැවසේ. අප පසෙහි ඉන්නා පනුවන් ගේ ක්‍රියාකාරකම් දැකීම පිළිකෙව් කරන්නා සේ, දේව සහ බ්‍රහ්මයින් මිනිසුන්ගේ ක්‍රියාකාරකම් ගැන උනන්දුවක් දක්වන්නේ නැත. එය ඇත්තෙන්ම රඳා පවතින්නේ එම විශේෂිත භවය ආශ්‍රිත මනෝ විහිතිය මතය.

එහෙත් "*ගන්ධබ්බයා* " මනුෂ්‍ය හෝ තිරිසන් "භව" ලබා ඇත්තේ හෙතෙම රළු ඉන්ද්‍රිය සංතර්පනයෙන් සතුටට පත්වීමට ඇති දැඩි ආශාව නිසාය: *"උපාදාන පච්චයා භව".*

9. මනුෂ්‍ය හෝ තිරිසන් "*ගන්ධබ්බයා*" අවසානයේදී සුදුසු ගර්භාසයකට ඇද ගැනීමෙන් පසු එය මව සහ පියාගේ ජන්මානු දෙකෙහි සංයෝගයෙන් සෑදුන සෛලයට ( Zygote : සංසේචිත ඩිම්භය) හා එක් වී කළලයට පදනම දමයි."මනෝමය කය - හැඳින්වීම " කියවන්න.

දැන් *ගන්ධබ්බයා* ඔහුගේ භෞතික සිරුර සඳහා පදනම දමා ඇති හෙයින් මුලින්ම ගර්භය තුල වැඩී පසුව තමාගේම සිරුරක් සඳහා උත්පත්තිය ලබයි. "සැබෑ මනුෂ්‍යයා"ට දැන් තමා බොහෝ සෙයින් ආශා කළාවූ ඝන ශරීරය ලැබී ඇත.

10. එහෙයින් අපට මෙම තද ඝන ශරීර ලැබී ඇත්තේ එය අප ප්‍රබල තියුනු ආශාවකින් අපේක්ෂා කළ නිසාය. අප මෙම රළු ඉන්ද්‍රිය සංතර්පනයෙන් සතුටට පත්වීමට ඇති දැඩි ආශාව ඇති තාක් අප උපදින්නේ කාම ලෝකයේය. දෙවියන් පවා කාමලෝක වාසීන්

වුවත් ඔවුනගේ ආශාවන් එතරම් රළු ඉන්ද්‍රිය සංතර්පනයෙන් සතුටට පත්වීම නොවේ. ඔවුනට සැප වින්දනය සඳහා එතරම් තදින් අල්වා ගැනීමට අවශ්‍ය නැත.

රූප ලෝක වල බ්‍රහ්මයින් රළු ඉන්ද්‍රිය සංතර්පනයෙන් සතුටට පත්වීමෙන් බොහෝ සෙයින් දුරස්ය. ඔවුනට රසයට, ගන්ධයට හෝ කයෙහි ස්පර්ශයට ආශාවක් නැත. දැකීම සහ ශ්‍රවණයෙන් සෑහීමට පත්වේ.

අරූපලෝක බ්‍රහ්මයිනට රූප දැකීමට හෝ ශබ්දවලට ආශාවක් නැත. මානසික සුඛ යෙන් පමනක් සතුටට පත්වේ. අරූප ලෝක වල පදාර්ථ පවතින්නේ ඉතා අවම වශයෙනි.

11. ඝන සිරුරක් පැවතීම නොයෙක් ආබාධවලට මෙන්ම වියපත් වීමත් සමග ජරාවට පත්වීමට ලක් වන බව අපට අවබෝධ නොවන දෙයකි.

එසේම, ඝන සිරුර නිසා ඉතා දුර පෙනීම සහ ඇසීම නැවතුනි. දැන් *ගන්ධබ්බයා බර ඝන* සිරුරු කබොල්ලක සිරවී ඇත, එහෙයින් දැකීම මෙන්ම ශ්‍රවණය කළ යුත්තේ එම සිරුරෙහි පවත්නා භෞතික ද්වාර ඔස්සේය. "අල්වා ගැනීමෙන් " ලබන්නාවූ අත්දැකීමට හා, රළු ආහාර සහ ලිංගික රසාස්වාදය වැනි දේ පිණිස කළ පරිත්‍යාගය එයයි.

*ගන්ධබ්බයා* තාවකාලිකව භාවිතා කරන්නාවූ මෙම භෞතික ශරීරයට (කරජා කය හෝ ආහාරජා කය) බුදුන් වහන්සේ "ගුහාව " හෙවත් " කබොල්ල" යයි වදාළ සේක. එයට සීමිත ජීවිත කාලයක් ඇත මෙම කාලය තුලදී එය වර්ධනය වී, දිරා ගොස් අවසානයේදී මරණයට පත්වේ. එවිට *ගන්ධබ්බයාට* තවත් සිරුරක් සොයා යෑමට සිදුවේ. විශේෂයෙන් කාමලෝකයේදී පැරණි සිරුර මරණයට පත්වූ විට නව "කබොල්ලක්" තනා ගැනීමට සිදු වේ. එසේම නව සිරුරක් ගොඩ නගා ගැනීමට සුදුසු ගර්භයක් ලැබෙන තෙක් අසහනයට පත් *ගන්ධබ්බයෙකු* සේ දිගු කලක් ගත කරයි.

එහෙයින්, දිරාපත්ව අවසානයේදී මරණයට පත්වන්නේ භෞතික ශරීරය පමනක් බව දැන් පැහැදිලි වනවා ඇති. මනුෂ්‍ය භවයට අදාල කම්ම ශක්තිය සියල්ල වැය වී නැතිනම් මනුෂ්‍ය *ගන්ධබ්බයා* විකසනය වෙමින් අතීත සිරුරට සමාන නව සිරුරක් සොයා ගනී. මනුෂ්‍ය භවයට අදාල කම්ම ශක්තිය සියල්ල වැය වී හමාර නම් මනුෂ්‍ය *ගන්ධබ්බයා* අතුරුදහන් ව ( දේව සහ බ්‍රහ්ම මරණයේදී සිදුවන ආකාරයටම) නව

භවය තිරිසන් භවයක් නම් නව තිරිසන් *ගන්ධබ්භයෙකු* පහල වේ. "භව සහ ජාති - යම් " ලොවක" පැවැත්ම හා එහි උපත සිදුවීම" කියවන්න.

එහෙයින් මනුෂ්‍යයින්ගේ සහ තිරිසනුන්ගේ පදනමද *ගන්ධබ්භයා ගේ* සියුම් ශරීරයයි එය දේව සිරුරට වඩා ඝන බවින් අඩු, රූපී බ්‍රහ්මයින්ගේ මෙන් සියුම් සිරුරකි. ඝන සිරුර මවගේ ගර්භාසය තුල වර්ධනය වීම අරඹා උත්පත්තියෙන් පසු ළදරුවෙක් ආහාර ගැනීමත් සමග වර්ධනය අඛණ්ඩව සිදුවේ.

12.ස්වභාව ධර්මය මෙම කබොල්ල හෙවත් භෞතික ශරීරය කම්ම විපාක දීම පිණිස භාවිතා කරයි. අපට මෙම සිරුර නිරන්තරයෙන් පිරිසිදු කිරීමට සිදු වේ. එසේම වැදගත් (සිරුරු කොටස්) අවයව ගැන නිතර සැලකිලිමත් විය යුතු වනවා. අප දෙවරක් නොසිතන්නාවු "භෞතික දුක්ඛ වේදනා"වන්ගේ කොටස්ය.

එහෙත්, නොයෙක් නොයෙක් ප්‍රසන්නාත්මක දේ අත්පත් කර ගැනීමෙන් ලබා ගත හැකියයි අපේක්ෂා කරන අනාගත සුඛයන්ගෙන් මෙම දැඩි දුෂ්කරතාවයන් ආවරණය වී ඇත. එසේම මෙම "අපේක්ෂා සහ සිහින" සැබෑ නොවුන විට අප බෙහෙවින් කනස්සල්ලට පත් වේ. බොහෝ සිය දිවි නසා ගැනීම් සිදුවන්නේ එවැනි අවස්ථාවන්හිදීය. මෙම මානසික දුක්ඛ වේදනාවන් ඉහත සඳහන් කළ "භෞතික දුක්ඛ වේදනා" වන්ට වඩා නරකය. ප්‍රසිද්ධ ධනවත් පුද්ගලයින් පවා සිය දිවි හානිකර ගන්නේ ඇයි දැයි කියවා බැලීමත් සුදුසු භාවනාවක් වේ. මෙහි පූර්ණ බලපෑම දැන ගැනීමට හා අනාගතයේදී දුක්ඛ වේදනා හට ගැනීමෙන් වැලකී සිටීමට පෙළඹීම පිණිස දුක්ඛ වේදනා හට ගන්නේ කෙසේදැයි අප අවබෝධ කර ගැනීම අවශ්‍යයය.

13.මෙම රචනයේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ භෞතික ශරීරයේ යථා ස්වභාවය පෙන්වා දීමයි. අපගේ සිරුරෙහි පෙනුම ගැන අප ප්‍රමෝධයට පත්වුවත් ( විශේෂයෙන් තරුණ අවධියේදී ) අප මෙතරම් අගය කරණ තාවකාලික "කබොල්ල" නිසා ඇතිවන්නාවු භෞතික වේදනා වයස් ගත වෙත්ම ,අත් විඳිය හැක. එය පවතින්නේ වසර 100ක් පමණය, ඉන් පසුව තවත් "කබොල්ල"ක් සොයා යන්නෙමු. ගිනිය නොහැකි කල්ප සම්භාරයක් පුරා අප කළේ මෙයයි.

14.අනෙක් වඩාත් වැදගත් කරුණ වන්නේ මනුෂ්‍ය ශරීරයේ විශේෂත්වය වන හොඳින් වර්ධනය වූ මොළයයි. "මොළය - මනස හා සිරුර අතර සම්බන්ධකය" කියවන්න. එයයි මනුෂ්‍ය ජීවිතය අති විශේෂ වන්නට හේතු වන්නේ, බුදුන්වහන්සේ දේශනා කළ ධර්මය අවබෝධ කර දුක්ඛ වේදනා පිරි සංසාර චක්‍රයෙන් ගැලවී යාමට ඉඩ සලසන්නේද එයයි.

කම්ම ශක්තිය මගින් කම්ම විපාක දීම පිණිස නිරිසතවයින්ගේ ශරීර සකස් කර ඇති අන්දම ( ඔවුනට අභිසංකාර විශේෂයෙන් පුණ්‍යාභිසංකාර කිරීමට නුපුළුවන) "නිරය පවතින්නේද? " යටතේ සාකච්ඡා කර ඇත.